Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය 2018 | 08 ශ්‍රේණිය
முதலாம் தவணைப் பரீட்சை | தரம் 08
First Term Test 2018 | Grade 08

ඉතිහාසය I II
வரலாறு I II
History I II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

- සියලුම ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තොරන්න.

1 1)ශ්‍රී ලංකාවේ බිහි වූ ප්‍රථම වැව ලෙස සැලකෙන්නේ,

(i) බසවක්කුලම වැව (ii) තිසා වැව

(iii) ජය වැව (iv) මින්නේරි වැව

2). මෙරට ජනාවාස වීම පිළිබඳ වඩාත් බලපෑම් ඇතිකළ ප්‍රථම ආර්‍ය කාණ්ඩායම ලංකාවට පැමිණි කාලය නිවැරදිව ගලපන්න.

(i) ක්‍රි . පු . 4 වන සියවස (ii) ක්‍රි . පු . 6 වන සියවස

(iii) ක්‍රි . ව. 5 වන සියවස (iv) ක්‍රි . ව . 6 වන සියවස

3). ශ්‍රී ලංකාවේ වියළි කළාපයට අයත් රාජධානි පමණක් ඇති පිළිතුර තෝරන්න.

(i) දඹදෙණිය හා අනුරාධපුරය (ii) මල්වතුඔය හා අනුරාධපුර

(iii) අනුරාධපුර හා පොළොන්නරුව (iv) අනුරාධපුර හා මහනුවර

4). මෙරට ඉතිහාසයේ මහා වැව් තැනවූ රජවරු යටතට අයත් නොවන රජතුමා කවුද ?

(i) වසභ රජු (ii) ධාතුසේන රජු

(iii) මහසෙන් රජු (iv) දේවානම්පියතිස්ස රජු

5). පොළොන්නරු රාජධානියේ බිඳ වැටීමට බල පෑ ප්‍රධානම හේතුව වන්නේ,

(i) රජවරු අතර ගැටුම් ඇතිවීම. (ii) කාලිංස මාසගේ ආක්‍රමණය.

(iii) විදේශ ආක්‍රමණ (iv) ස්වභාවික හේතු

6). ධාතුසේන රජු ඉදිකළ යෝද වැව මෙරට පිහිටා ඇති ප්‍රදේශය නිවැරදිව තෝරන්න.

(i) මන්නාරම (ii) අනුරාධපුර

(iii) සීගිරිය (iv) පොළොන්නරුව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

7). ''ලක්දිව පුරාතන වාරිමාර්ග'' යනුවෙන් ප්‍රශස්ත කෘතියක් රචනා කළේ,

(i) එච්.සී.පී. බෙල් මහතා (ii) ආර්.එල්. බ්‍රොහියර් මහතා

(iii) සෙනරත් පරණවිතාන මහතා (iv) මහානාම හිමි

8). සීගිරියේ දක්නට ලැබෙන ජල තාක්ෂණික අංගයට ඇතුළත් නොවන්නේ මින් කුමක්ද ?

(i) ජල මල් (ii) පොකුණු

(iii) වැව් (iv) දිය අගල්

9). පහත සඳහන් ඒවායින් ආගමික ගොඩනැගිල්ලකට අයත් වන්නේ කුමක්ද ?

(i) චෛතියඝර (ii) රාජමාලිගා

(iii) රෝහල් (iv) දානශාලා

10). ශ්‍රී ලංකාවේ අවසන් රාජධානිය ලෙස සැලකෙන්නේ,

(i) කෝට්ටේ (ii) මහනුවර

(iii) යාපහුව (iv) පොළොන්නරුව

(ලකුණු 20 )

(2) A හා B නිවැරදිව යා කරමින් වැවක අංග වලින් සිදුවන සේවා ගලපන්න.

(i) සොරොව්ව A) ජල පීඩනය පාලනය කර සොරොව්වෙන් ජලය බෙදා දීම.

(ii) පිටවාන B) වැවේ ජල ධාරාව රඳවා ගැනීම.

(iii) රළපනාව C) වැවේ ඇතිවන රැළි මගින් වැව් බැම්ම ආරක්ෂා කිරීම.

(iv) බිසෝකොටුව D) වැවේ ජලය වගාවන් සඳහා බෙදාදීම.

(v) වැව් බැම්ම E) අතිරික්ත ජලය බැහැර කිරීම.

(ලකුණු 10 )

(3) පහත සඳහන් වාක්‍ය නිවැරදිනම් ( √ ) ලකුණද, වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

(i) ශ්‍රී ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා වන්නේ H.C.P. බෙල් මහතාය. ( )

(ii) පොළොන්නරුවේ රන්කොත් වෙහෙර ඉදිකළේ නිශ්ශංකමල්ල රජුය. ( )

(iii) අනුරාධපුර රාජධානි සමයේ ශිව දේවාල 2 ක් ඉදිවී ඇත. ( )

(iv) මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා II වන විමලධර්මසූරිය රජුය. ( )

(v). '' අශ්වහිස සහ මිනිසා '' දැක්වෙන කැටයම ඉසුරුමුණි විහාරයේ දක්නට ලැබේ. ( )

( ලකුණු 10 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


II පත්‍රය

- මෙහි 1 ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න වලින් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1).

(i) පහත සඳහන් ලංකා සිතියමේ දැක්වෙන අක්ෂර වලට අදාළ නිවැරදි ස්ථාන වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

(යාපනය, කොළඹ. මහවැලි ගඟ, මල්වතු ඔය, ත්‍රිකුණාමලය, මහනුවර)




A -

B -

C -


D -

E -

F -

(ලකුණු 06 )

(ii) පහත සඳහන් ලෝක සිතියමේ දැක්වෙන අක්ෂර වලට අදාළ නිවැරදි ස්ථාන වරහන් තුළින් තෝරා ඉදිරියේ ලියා දක්වන්න.




(සුභපැතිමේ තුඩුව, අප්‍රිකා මහද්විපය, උතුරු ඇමරිකාව, පෝක් සමුද්‍ර සන්ධිය, ජපානය, ඉන්දියාව)

A –

B –

C –

D –

E –

F –

(ලකුණු 06)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

2).

(i) අනුරාධපුර යුගයට අයත් රජවරු තිදෙනෙක් නම් කරන්න.

(ලකුණු 3 යි )

(ii) මෙරට අතිතයේ යකඩ නිස්සාරණය සිදු කළ බවට සාධක ලැබී ඇති ප්‍රදේශ 2 නම් කරන්න.

(ලකුණු 4 යි )

(iii) ලංකාවේ විශාල වැව් ඉදිවීමට බල පෑ ප්‍රධාන හේතු 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 යි )

3).

(i) වැවක අංග 3 ක් නම් කරන්න.

(ලකුණු 3 යි )

(ii) ධාතුසේන රජු හා වසභ රජු ඉදිකළ ඇළ මාර්ග 2 ක් පිළිවෙළින් නම් කරන්න.

(ලකුණු 4 යි )

(iii) අතීත ලංකාවේ පොකුණු තැනවීමේ අරමුණු 2 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 5 යි )

4).

(i) අතීතයේ මෙරට මැටි තාක්ෂණය යොදා නිපද වූ දෑ 3 ක් ලියන්න.

(ලකුණු 3 යි )

(ii) අතීතයේ මෙරට මැටි තාක්ෂණය යොදා නිපද වූ භාණ්ඩ පෝරණුවක් තුළ පුළුස්සා ගැනීමෙන් අරමුණු කරගත් කරුණු 2 ක් ලියන්න.

(ලකුණු 4 යි )

(iii) සීගිරියේ දක්නට ලැබෙන තාක්ෂණික අංග 2 ක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(ලකුණු 5 යි )

5).

(i) අනුරාධපුර යුගයට අයත් සඳකඩපහනේ දැකිය හැකි සත්ව රූප 3 ක් නම් කරන්න.

(ලකුණු 3 යි )

(ii) පොළොන්නරු යුගයේ මෙරට හින්දු ආගම පැවති බවට සාධක 2 ක් ලියන්න.

(ලකුණු 4 යි )

(iii) අනුරාධපුර යුගයට අයත් දාගැබ් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 5 යි )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

6).

(i) මහනුවර රාජධානිය හැඳින්වූ වෙනත් නම් 3 ක් ලියන්න.

(ලකුණු 3 යි )

(ii) මහනුවර රාජධානිය පාලනය කළ සිංහල රජවරුන් දෙදෙනෙක් හා නායක්කාර් වාංශික රජවරු දෙදෙනෙකු පිළිවළින් නම් කරන්න.

(ලකුණු 4 යි )

(iii) ආරක්ෂාව සම්බන්ධයෙන් මහනුවර රාජධානියේ පිහිටීම ඉතා වැදගත් වූ බව කරුණු 2 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 5 යි )